# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | 1 ඒකකය |
|---|---|---|

## සමාජ සුරක්ෂිතතාව

- **ප්‍රශ්න අංක 1-5 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. සමාජයක මූලික තැනුම් ඒකකය වන්නේ,

(1). පුද්ගලයා (2). සමාජය (3). පවුල (4). ගෙය

02. සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු වැදගත් කාර්යයක් වන්නේ,

(1). ආහාර හා පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම
(2). සමාජ යුතුකම් හා වගකීම් ඉටු කිරීම
(3). යහපත් සමාජානුයෝජනයක් සඳහා මග පෙන්වීම
(4). ප්‍රජා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම

03. ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල්භාවය ඉවත් කිරීමට කටයුතු කළේ,

(1). තෝමස් අල්වා එඩිසන් (3). ආතර් සී. ක්ලාක්
(2). ඒබ්‍රහම් ලින්කන් (4). ජනාධිපති කෙනඩි

04. අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදකි.

(1). ගිවිසුම් කඩ කිරීම (3). මංකොල්ලකෑම
(2). ඉඩම් ආරවුල් (4). පවුල් ආරවුල්

05. ''ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී'' මෙම ආදර්ශ පාඨය☐

(1). ගුවන් හමුදාවේ ය. (3). නාවික හමුදාවේ ය.
(2). පොලිසියේ ය. (4). යුධ හමුදාවේ ය.

- **අංක 6-10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

06. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායක වන ආයතන අතර ................................................ ආයතන වැදගත් වේ.

07. සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම හා සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීමට ක්‍රියාත්මක ආයතනයක් වන්නේ ................................................ යි.

08. රාජ්‍ය විසින් පනවනු ලබන සමස්ත රෙගුලාසි පද්ධතිය ................................................ ලෙස සරලව හඳුන්වයි.

09. ................................................ රටකින් රටකට වෙනස් වේ.

10. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කරන ආයතන අතරින් එකකි ................................................

(මධ්‍යම පරිසර අධිකාරිය / දේශීය නීතිය / ආගමික / නීතිය / ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

- **11-15 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

11. ''ඔබ කුමක් කළත් හොඳ කෙනෙක් වෙන්න.'' මෙම කියමන ඒබ්‍රහම් ලින්කන් මහතාගේය. ( )
12. ''සුරකිම ලකඹර'' යන්න ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදර්ශ පාඨය නොවේ. ( )
13. සමාජ සුරක්ෂිතතාව නිසි පරිදි තහවුරු වීම ජාතික සංවර්ධනයටත්, තිරසර සාමයටත් එක සේ වැදගත් වේ. ( )
14. අධ්‍යාපනික ප්‍රදර්ශනවලට සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගි වීම ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ කටයුත්තකි. ( )
15. ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳව සෘජු දුරකථන අංකය 1939 වේ. ( )

- **අංක 16-20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16. ශ්‍රී ලංකාවේ සමථකරණය සඳහා දැනට පවතින ක්‍රමය හඳුන්වා දී ඇති වර්ෂය ලියන්න.
    ..............................................................................................
17. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ආදර්ශ පාඨය කුමක්ද? ..............................................................................................
18. පන්සලේ පියතුමා ලෙස හඳුන්වන්නේ කවුරුන්ද? ..............................................................................................
19. ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණ ආයතනය නම් කරන්න.
    ..............................................................................................
20. ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමු කළ හැකි ක්‍රම තුනෙන් එකක් ලියන්න.
    ..............................................................................................

(02 × 20 = 40)

## <u>II කොටස</u>

01. (1). තම නිවස පාසල බවට පත් වූ, තම ගුරුවරිය මව වූ සියවසේ ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු බවට පත් වූ පුද්ගලයා කවුද? (ල.01)
    (2). සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන 2ක් නම් කරන්න. (ල.02)
    (3). සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමට විවිධ සමාජ ආයතන මගින් ඉටු කරන කාර්යයන් 4ක් ලියන්න. (ල.04)
    (4). ඔබ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන එවැනි සමාජ ආයතනයක කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

02. (1). නීතියේ ආධිපත්‍යය නිසි පරිදි ක්‍රියාත්මක වන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණය කුමක්ද? (ල.01)
    (2). නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදා දක්වන ප්‍රධාන කොටස් 2 නම් කරන්න. (ල.02)
    (3). නීතිය බලාත්මක කිරිම සඳහා පවතින විවිධ ආයතන වර්ග 4ක් නම් කරන්න. (ල.04)
    (4). ඉන් එක් ආයතනයක කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

03. (1). රටක යුක්තිය පසිඳලන ආයතනය කුමක්ද? (ල.01)

(2). ආරක්ෂක හමුදා සම්බන්ධ පුද්ගල වගකීම් 2ක් ලියන්න. (ල.02)

(3). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනෙකුත් නීතිරීති සම්බන්ධයෙන් පුද්ගල වගකීම් හා යුතුකම් 2 බැගින් ලියන්න. (ල.04)

(4). පවතින වසංගත තත්ත්වය හමුවේ සමාජ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට ආරක්ෂක අංශ ගන්නා මෙහෙවර වෙනුවෙන් පුද්ගලයන් ලෙස අපිට ඉටු කළ හැකි යුතුකම් හා වගකීම් මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

04. (1). ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් නිරාකරණයට පිහිටුවා ඇති ආයතනය කුමක්ද? (ල.01)

(2). සමථ මණ්ඩල සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 2ක් ලියන්න. (ල.02)


(3). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය මගින් ඉටු කෙරෙන ප්‍රධාන සේවා 4ක් ලියන්න. (ල.04)


(4). ළමා ආරක්ෂණ අධිකාරියේ සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් දක්වන දායකත්වයට අපට සහාය විය හැකි ආකාරය විස්තර කරන්න. (ල.05)

05. (1). මානව හිමිකම් ආරක්ෂා කිරීමට මෙරට පිහිටුවා ඇති ආයතනය කුමක්ද? (ල.01)

(2). මානව හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත පනත් අංකය සඳහන් කරන්න. (ල.02)

(3). පහත සඳහන් රූප සටහන් නම් කරන්න. (ල.04)


(a)


(b)


(c)


(d)

(4). මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 5ක් ලියන්න. (ල.05)

(12 × 05 = 60)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk